(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 208.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2012 අගෝස්තු මස 22 වැනි බදාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1383/'11

1.

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2009, 2010 සහ 2011 යන වර්ෂවලදී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය,

(i) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) ශේෂ පත්‍ර සමඟ අවසාන ගිණුම් වාර්තා කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 සහ 2011 වර්ෂවල මුදල් ප්‍රවාහය කවරේද;

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වත්කම් කවරේද;

(iii) ක්‍රීඩාංගන සහ අනෙකුත් කරුණු සඳහා දරන ලද රුපියල් මිලියනය ඉක්මවූ සමස්ත පිරිවැය කවරේද;

(iv) ඉහත සඳහන් පිරිවැය යෙදවූ ආකාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ස්ථිර සහ තාවකාලික කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2010 වර්ෂය සහ 2011 වර්ෂයේ මේ දක්වා වූ කාලය තුළ එම කාර්ය මණ්ඩලයට සිදු කළ ගෙවීම් වෙනුවෙන් වැය කළ සමස්ත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1643/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි බඳුරාවල රජයේ පාසල වසා දමා ඇති බවත්;

(ii) මේ වන විට එම පාසලට අයත් රුපියල් ලක්ෂ ගණනාවක් වටිනා ගොඩනැගිලි දිරාපත් වෙමින් පවතින බවත්;

(iii) ප්‍රදේශයේ දරුදැරියන් සඳහා නැවත පාසල විවෘතකර දෙන මෙන් ප්‍රදේශවාසීන් ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල නැවත විවෘත කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම පාසල විවෘත නොකරන්නේ නම්, වෙනත් ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

(iii) එම පාසල යොදා ගැනීමට අපේක්ෂිත ආර්ථික කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1987/'11

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂය වන විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තිබූ සියලුම විශ්වවිද්‍යාල සහ ඒවාට අයත් ආයතනවලට ආරක්ෂක සේවාවන් සැපයීමේ කාර්යය පවරා තිබූ පෞද්ගලික ආරක්ෂක සේවා සැපයුම් ආයතන කවරේද;

(ii) ඉහත එක් එක් ආරක්ෂක ආයතන විසින් ආරක්ෂාව සපයනු ලබන විශ්වවිද්‍යාල සහ ඒවාට අයත් ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2010 වර්ෂය වනවිට එක් එක් විශ්වවිද්‍යාලයෙහි සේවයේ යොදවා සිටි ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව සහ මේ වන විට යොදවා ඇති ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එක් ආරක්ෂක නිලධාරියෙකු සඳහා 2010 වර්ෂයේදී ගෙවන ලද මුදලත් මේ වනවිට ගෙවන මුදලත් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත එක් එක් ආයතනය විසින් මාසිකව ආරක්ෂාව සඳහා වැයකරන මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2349/'12

4.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 වන විට එක් එක් පළාත් සභාව යටතේ ලියාපදිංචි කර ඇති පෙර පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පෙර පාසල් සහ පෙර පාසල් ගුරුවරු ලියාපදිංචියට අදාළ ප්‍රඥප්ති හෝ නීති සම්පාදනය කොට ඒ අනුව කටයුතු කරන පළාත් සභා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2502/'12

5.

ගරු තලතා අතුකෝරල මහත්මිය,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුළුතොට, කඩමුදුන පිහිටි සංචාරක නිවාසය ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයට අයත් වන්නේද;

(ii) එම සංචාරක නිවාසය මේ වනවිට නිවාස සංවර්ධන අධිකාරිය මගින් බදු දී තිබේද;

(iii) එය බදු දීමේදී පිළිගත් ටෙන්ඩර් පරිපාටියක් අනුගමනය කර තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත්වූ මිල ගණන් කවරේද;

(v) එම සංචාරක නිවාසය බදු දුන් ටෙන්ඩරයේ වටිනාකම කොපමණද;

(vi) එම ටෙන්ඩරය ඉදිරිපත්වූ වැඩිම වටිනාකමින් යුතු ටෙන්ඩරය නොවන බව පිළිගන්නේද;

(vii) එසේ නම්, එම බදු ගිවිසුම අවලංගු කර නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2623/'12

6.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දුම්රිය දෙපාර්තමේන්තුවේ II වැනි පන්තිය තාක්‍ෂණික ශිල්පීන් බඳවා ගැනීම සඳහා ලිඛිත පරීක්‍ෂණයක් 2010.07.31 දින පවත්වනු ලැබුවේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් තාක්ෂණික ශිල්පීන් බඳවා ගැනීමට,

(i) ලිඛිත විභාගයක් පැවැත්වීමට අදාළ ගැසට් නිවේදනය පළ කළ දිනය;

(ii) ප්‍රායෝගික පරීක්‍ෂණ පවත්වන ලද දිනය;

(iii) සම්මුඛ පරීක්‍ෂණ පවත්වනු ලැබූ දිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දුම්රිය දෙපාර්තමේන්තුවේ පවතින ඉහත (ආ) හි සඳහන් පරීක්ෂණ සමත්වන්නන්ගෙන් පිරවීමට අපේක්ෂිත II වැනි පන්තිය තාක්‍ෂණික ශිල්පී තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2778/'12

7.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) සන්නිවේදන කටයුතු උදෙසා ශ්‍රී ලංකාවට ඉහළ අහසේ චන්ද්‍රිකාවක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතියෙන් ළඟා කර ගැනීමට අපේක්ෂා කරන අරමුණු කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2849/'12

8.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය විවිධසේවා සමූපකාර සමිතියට අයත් දෙමහල් ගොඩනැගිල්ලක් බදු දීමට 2011 දෙසැම්බර් 19 දින පුවත්පත් දැන්වීමක් මගින් ටෙන්ඩර් කැඳවූයේද;

(ii) එසේ නම්, ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(iii) පිළිගත් පටිපාටිය අනුව ටෙන්ඩර් කැඳවීමකදී සලකා බලන සහ ප්‍රමුඛතාවය ලබා දෙන කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ගොඩනැගිල්ල,

(i) ලබා ගැනීමට රුපියල් 320,000/- ක් සහ රුපියල් 355,000/- ලෙස මිල ගණන් ඉදිරිපත්ව තිබූ බවත්;

(ii) ටෙන්ඩර් අයදුම්පතක් හෝ ඉදිරිපත් නොකළ පුද්ගලයකුට මේ වන විට ලබා දී ඇති බවත්;

(iii) බදු දීමේදී අක්‍රමිකතාවයක් සිදු වී ඇති බවත්;

(iv) අක්‍රමිකව ලබාදීම නිසා අයදුම්කරුවන්ට අසාධාරණයක් මෙන්ම අදාළ සමූපකාර සමිතියට අලාභයක් සිදුව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහළම ටෙන්ඩරයට ගොඩනැගිල්ල ලබා නොදීමට හේතු කවරේද;

(ii) දැනට ගොඩනැගිල්ල ලබා දී ඇති අයගෙන් සමූපකාර සමිතිය ලබා ගන්නා මුදල කොපමණද;

(iii) ඉහත අක්‍රමිකතාව සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකොට ටෙන්ඩර්කරුවන්ට සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා කොපමණ කාලයක් ගතවේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1835/'11

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 - 2012 අධ්‍යයන වර්ෂය සඳහා රජයේ විශ්වවිද්‍යාලවලට තෝරා ගන්නා ලද ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා තොරතුරු තාක්ෂණය සහ ඉංග්‍රීසි පාඨමාලා පැවැත්වීමට කටයුතු කර ඇති බවත්;

(ii) ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් විසි දෙදෙනෙකු පුහුණු කර ඇති බවත්;

(iii) එම නිලධාරීන් නොසලකා හැර නුපුහුණු නිලධාරීන් යොදා ගෙන මෙම පාඨමාලාවන් පවත්වාගෙන යන බවත්;

(iv) ඒ හේතුවෙන් එම පාඨමාලාවල ගුණාත්මකභාවය හීන වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාලවල ඉහත සඳහන් පාඨමාලා පැවැත්වීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) එම අරමුදල් වියදම් කරන ක්‍රමවේද කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2125/'11

10.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කල්මුනේ හා වවලකඩේ මාර්ගයේ පිහිටා ඇති කිත්තංගි පාලම ඉදිකිරීම ආරම්භ කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එකී ඉදිකිරීම් ආරම්භ කළ යුතුව තිබූ දිනය හා අවසන් කළ යුතුව තිබූ දිනය කවරේද;

(iv) මේ වන විට එකී ඉදිකිරීම් අවසන් කර තිබේද;

(v) අවසන් කළ යුතුව තිබූ දිනට අවසන් නොකළේ නම්, ඒ සඳහා ප්‍රමාද ගාස්තු අය කරගෙන තිබේද;

(vi) එසේ නම්, එම මුදල කොපමණද;

(vii) එකී ඉදිකිරීම් කළ සමාගමේ නම කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2350/'12

11.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය වනවිට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිය ලබා ඇති පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාවන් කවරේද;

(ii) එම පාඨමාලාවන් පවත්වනු ලබන ආයතනවල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාවක් හදාරා ඇති පෙර පාසල් ගුරුවරු සංඛ්‍යාව එක් එක් පළාත හෝ දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1836/'11

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල තේ සහ රබර් වතු ආශ්‍රිතව ජීවත් වන ජනතාවගෙන් බහුතරයකට උප්පැන්න සහතික නොමැති බවත්;

(ii) එම නිසාම ජාතික හැඳුනුම්පත් ලබාගැනීමට නොහැකිවී ඇති බවත්;

(iii) ඒ හේතුවෙන් මැතිවරණ ලේඛනවල නම ඇතුළත් නොවීමෙන් ඡන්ද බලය පවා අහිමිව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රදේශයන්හි ජීවත්වන උප්පැන්න සහතික නොමැති අයට ඒවා ලබා දීම සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත දිස්ත්‍රික්කයන්හි ද්‍රවිඩ ජනතාව ජීවත් වන ප්‍රදේශ සමග සිංහල ජනතාව නියෝජනය කරන ග්‍රාම නිලධාරී කොට්ඨාස ඒකාබද්ධ කිරීම නිසා රාජකාරී ඉටුකර ගැනීමේදී ජනතාවට භාෂාව පිළිබඳ ගැටලු මතුවී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය මගහරවා ගැනීම සඳහා තම භාෂාවෙන් රාජකාරී ඉටුකර ගැනීමට හැකි වන පරිදි ග්‍රාම නිලධාරීන් පත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

2126/’11

13.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමට හැර අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ලබා දී ඇති මාර්ග සංවර්ධන අධිකාරිය සතු වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන ලබා දුන් දිනයන් කවරේද;

(iii) ලබා දුන් එම වාහනවල අංක සහ වර්ගයන් කවරේද;

(iv) එම වාහන ලබා දීමට හේතු කවරේද;

(v) මේ වන විට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ආපසු ලබාගත් වාහන කවරේද;

(vi) එසේ ආපසු ලබා ගත් වාහනවල තත්ත්වය පිළිබඳව විස්තර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රණවිරු සේවා අධිකාරිය (සංශෝධන),— 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

### යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතුය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2012 සැප්තැම්බර් මස 18 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5.

ගරු හුනෛයිස් ෆාරුක් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"අල්-ජාමිඅතුල් ඉස්ලාමියියා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

දිවි නැගුම පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ

සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*5.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*6.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*9.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

10.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

11.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

12\.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13\.

කාසිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

14\.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

15\.

ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1631/'11

1\.

ගරු රාජීව විජේසිංහ මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැළැක්වීම් පනත යටතේ,

(i) යම් කිසි ඉල්ලීමක් මත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනය අවසන් වන තෙක් අධිකරණය විසින් අතුරු ආරක්ෂණ නියෝගයක් නිකුත් කළ යුතු බවත්;

(ii) ඉල්ලීම ඉදිරිපත් කළ දින සිට දින 14ක් ඇතුළත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනයක් පැවැත්වීමට අධිකරණය විසින් නියෝගයක් නිකුත් කළ හැකි බවත්; සහ

(iii) අතුරු ආරක්ෂණ නියෝගයක් මාස 12 නොඉක්මවන කාල සීමාවක් සඳහා බල පැවැත්වෙන බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) (i) එම නම් කරන ලද කාල සීමාවට පසු විමර්ශන නොපැවැත්වූ සහ විමර්ශන පැවැත්වූ නඩු කවරේද;

(ii) මෙම නීතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවූ මහේස්ත්‍රාත්වරුන්ට මග පෙන්වීම සඳහා යොදා ගන්නා ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ එම නිසා ප්‍රමාදයන්ට ලක්වූ වින්දිතයන්ට ගෙවීමට තිබෙන වන්දි ප්‍රමාණය කවරේද;

(iii) අතුරු නියෝග නොවන නියෝග සඳහා අවසන් දිනයක් තිබීමටත්, අතුරු නියෝග සඳහා එවන් දිනයක් නොතිබීමටත් හේතුව කවරේද;

(iv) එම විෂමතාව නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1632/’11

2.

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) 2001 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී, 1841 අයාල ආඥාපනත යටතේ අත්අඩංගුවට ගත් සහ රක්ෂිත බන්ධනාගාරගත කළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කොට සිටි අය අතුරින් තවමත් බන්ධනාගාරගතව සිටින හෝ වෙනත් ස්ථානවල රඳවා සිටින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අයාල ආඥාපනතෙහි සඳහන් වන ''නිවැරදි කළ නොහැකි නොදැමුණු පුද්ගලයන්'' (Incorrigible Rogues) යන පදයෙහි අර්ථය කවරේද;

(ii) එම පදය භාවිතාකොට ඇත්තේ කවර අරමුණකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අයාල ආඥාපනතට සිදු කරන ලද වෙනස්කම් පිළිබඳව 2004 වසරේදී මානව හිමිකම් කොමිසම ඉදිරියේ නිර්දේශ ඉදිරිපත් කරන ලද බව පිළිබඳව සහ ඒවා භාවිතා කරන ආකාරය එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා පියවර ගනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, එම ආඥාපනත යටතේ වන ව්‍යවහාරයන් සඳහා වන වෙනස් කිරීම් තහවුරු කිරීමට ගනු ලබන අනෙකුත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2073/’11

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂය සඳහා ලක් සතොස ආයතන වෙත පරිප්පු සපයනු ලැබූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ව්‍යාපාර නාමයන් කවරේද;

(ii) එම සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනයකර තිබේද;

(iii) එසේ නම්, එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය අනුව සැපයුම්කරුවන් විසින් පරිප්පු සැපයීම සිදුකළ යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2074/'11

4.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂය සඳහා ලක් සතොස ආයතන වෙත සීනි සපයනු ලැබූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ව්‍යාපාර නාමයන් කවරේද;

(ii) එම සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනයකර තිබේද;

(iii) එසේ නම්, එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය අනුව සැපයුම්කරුවන් විසින් සීනි සැපයීම සිදුකළ යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2075/'11

5.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂය සඳහා ලක් සතොස ආයතන වෙත බිත්තර සපයනු ලැබූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ව්‍යාපාර නාමයන් කවරේද;

(ii) එම සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය අනුව සැපයුම්කරුවන් විසින් බිත්තර සැපයීම සිදුකළ යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2076/'11

6.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ ලක් සතොස ආයතන පිහිටුවා ඇති ස්ථාන කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂය සඳහා ලක් සතොස ආයතන වෙත කුකුල් මස් සපයනු ලැබූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ව්‍යාපාර නාමයන් කවරේද;

(ii) එම සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනයකර තිබේද;

(iii) එසේ නම්, එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය අනුව සැපයුම්කරුවන් විසින් කුකුල් මස් සැපයීම සිදුකළ යුතු කාල සීමාව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?